# සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
## கலாசார அலுவல்கள் திணைக்களம்
## Department of Cultural Affairs

8 වන මහල සෙත්සිරිපාය බත්තරමුල්ල 8ஆம் மாடி, செத்சிறிபாய, பத்தரமுல்ல 8th floor, Sethsiripaya, Battaramulla

සොඳුරු දේශයක පෙරගමන්කරු வளமான தேசத்தை நோக்கி முன் செல்பவர் *Trailblazer of a Beautiful Nation*


| මගේ අංකය / எனது இல. / My No. | DCA/05/04/2025 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2025.04.25 |
|---|---|---|---|---|---|

නිවුණු හැදුණු පිරුණු සොඳුරු මිනිසුන් සපිරි පින්බර දේශයක් එක්ව ගොඩනගමු
அமைதியான, ஒழுக்கமான, முழுமையான சிறந்த மனிதர்களைக் கொண்ட தேசத்தை ஒன்று சேர்ந்து கட்டியெழுப்புவோம்
Towards building a blessed nation of compassionate, complete and culturally rich human beings

දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 04/2025
සියලුම දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම්

**<u>ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික සාහිත්‍ය උත්සවය - 2025</u>**

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව පවත්වනු ලබන ජාතික සාහිත්‍ය උත්සවය මෙම වර්ෂයේ දී ද ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් අදියර 03ක් යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිතය.

අරමුණු

- ❖ කලා මාධ්‍යයක් ලෙස සාහිත්‍ය කලාව ප්‍රවර්ධනය කිරීම.
- ❖ ප්‍රාදේශීය සාහිත්‍යධරයින්ගේ නිර්මාණ කුසලතා එළිදැක්වීමට අවස්ථාවක් සැලසීම.
- ❖ නව පරපුර තුළ පොත්පත් පරිශීලනය හා කියවීමේ රුචිකත්වය වර්ධනය කිරීම.
- ❖ ළමා හා තරුණ නිර්මාණකරුවන් නව තේමාවන් ඔස්සේ නිර්මාණකරණයට යොමු කිරීම.
- ❖ සමාජය තුළ සාහිත්‍ය කලාව පිළිබඳ පවත්නා ආකල්ප සංවර්ධනය කිරීම.
- ❖ පොදුවේ සාහිත්‍ය කලාවේ රසය සමාජගත කිරීම තුළ රසවින්දන ශක්තියෙන් හෙබි, සංවේදී අනාගත පරපුරක් බිහි කිරීම.

**<u>තරග සංවිධාන සැලසුම</u>**

ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ තරග ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක කරනු ඇත. ජාතික මට්ටමේ අවසන් අදියරේ තරග සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබේ.

**<u>ප්‍රාදේශීය සාහිත්‍ය තරග</u>**

- ❖ මෙහි මූලික තරග, එනම් ප්‍රාදේශීය තරග ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් පැවැත්විය යුතුය. ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් තම බල ප්‍රදේශ තුළ පවත්නා පාසැල්, කලා සංගම්, කලායතන, දහම් පාසල්, පිරිවෙන්, විශ්වවිද්‍යාල හා සංස්කෘතික බල මණ්ඩල ඇතුළු අනෙකුත් සියලු අධ්‍යාපන ආයතන හා උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙත ප්‍රාදේශීය සාහිත්‍ය තරග පිළිබඳව ලිඛිතව දැනුවත් කිරීමට කටයුතුකළ යුතු අතර, මහජනයා ගැවසෙන පොදු ස්ථානවල ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීමටද කටයුතු කළ යුතුය.

- ❖ දිස්ත්‍රික් හා ජාතික මට්ටමේ අදියරයන්හිදී ඇගයීමට ලක් කෙරෙනුයේ මෙම මූලික තරග හරහා තේරී පත් වන නිර්මාණ වන බැවින්, ජාතික මට්ටමේ තරගාවලියකට උචිත අන්දමේ ගුණාත්මක නිර්මාණ වැඩි වශයෙන් තෝරා ගැනීමට කටයුතු කළ යුතු අතර, එම නිර්මාණ සුදුසුකම්ලත් විනිශ්චය මණ්ඩලයක් යටතේ විනිශ්චය කිරීමට වග බලා ගත යුතුය.

- ❖ සියලුම තරග අංශ සඳහා වඩා වැඩි නිර්මාණකරුවන් පිරිසක් සහභාගී කරවා ගැනීමට අවශ්‍ය කටයුතු සැලසීම අදාළ නිලධාරීන් සතු වගකීමක් වේ. එසේම නිර්මාණකරුවන් නිර්මාණකරණය සඳහා දායක කර ගැනීමට අවශ්‍ය ප්‍රචාරක කටයුතු සිදු කිරීමට ද පියවර ගත යුතුය. (ප්‍රසිද්ධ දැන්වීම්, සමාජ මාධ්‍ය ජාලා භාවිතා කිරීම ආදී)

- ❖ නිර්මාණ භාර ගැනීම සහ ප්‍රායෝගික තරග පැවැත්වීම 2025 ජූලි මස 30 දින වන විට අවසන් කළ යුතු ය.

- ❖ නිර්මාණ විනිශ්චය කිරීම සඳහා එක් එක් තරග අංශ පිළිබඳව ප්‍රාමාණික දැනුමක් සහිත අවම වශයෙන් තිදෙනෙකුගෙන් සමන්විත සමීක්ෂණ මණ්ඩලයක්, ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය මත පත්කර ගත යුතු ය.

- ❖ එක් එක් තරග ශීර්ෂ මගින් ප්‍රථම ස්ථානය ලබාගත් නිර්මාණ සමග ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන ලබාගත් ජයග්‍රාහකයින්ගේ ප්‍රතිඵල ලේඛන ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ඇතිව 2025 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර අදාළ දිස්ත්‍රික් ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය. (දෙවන හා තෙවන ස්ථාන ලද නිර්මාණ අවශ්‍ය අවස්ථාවලදී පරීක්ෂා කිරීම සඳහා ලබා ගත හැකි පරිදි සුරක්ෂිතව තබා ගත යුතුය.)

- ❖ ප්‍රාදේශීය සාහිත්‍ය උත්සව 2025 සැප්තැම්බර් මස අවසන්වීමට ප්‍රථම පැවැත්වීමට කටයුතු කළ යුතු ය.

<u>දිස්ත්‍රික් සාහිත්‍ය තරග</u>

- ❖ ඒ ඒ දිස්ත්‍රික්කයන්ට අදාළ සියලු ප්‍රාදේශීය සාහිත්‍ය තරගයන්හි ප්‍රතිඵල 2025 අගෝස්තු මස 15 වන දිනට පෙර දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ගෙන්වා ගැනීමට පියවර ගත යුතු ය.

- ❖ නිර්මාණ විනිශ්චය කිරීම සඳහා එක් එක් තරග අංශ පිළිබඳව ප්‍රාමාණික දැනුමක් සහිත අවම තිදෙනෙකුගෙන් සමන්විත සමීක්ෂණ මණ්ඩලයක්, දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය මත පත්කර ගත යුතු ය.

- ❖ දිස්ත්‍රික් මට්ටමින් එක් එක් තරග අංශයන්ට අදාළව ප්‍රථම ස්ථාන ජයග්‍රහණය කරන ලද නිර්මාණ සමඟ ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන ලබා ගත් ජයග්‍රාහකයන්ගේ තරග ප්‍රතිඵල ලේඛන දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය සහිතව 2025 ඔක්තෝම්බර් මස 01 වන දිනට පෙර සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ වෙත යොමු කිරීමට අවශ්‍ය පියවර ගත යුතු ය.

- ❖ දිස්ත්‍රික් සාහිත්‍ය උත්සව 2025 නොවැම්බර් මස අවසන් වීමට ප්‍රථම පැවැත්වීමට කටයුතු කළ යුතු ය.

ජාතික සාහිත්‍ය තරග

- එක් එක් තරග අංශයන්ට අදාළව දිස්ත්‍රික් මට්ටමින් ප්‍රථම ස්ථාන ලබා ගන්නා ලද නිර්මාණ විද්වත් විනිශ්චය මණ්ඩල තුනක් වෙත යොමු කරනු ලැබේ.

- දිස්ත්‍රික් මට්ටමේ දි ප්‍රායෝගික තරගවලින් ප්‍රථම ස්ථාන ලබාගත් ජයග්‍රාහකයින් සඳහා පවත්වනු ලබන ප්‍රායෝගික තරග සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් තෝරාගත් ස්ථානයක දි පූර්ව දැනුවත් කිරීමකින් අනතුරුව පවත්වනු ලබයි.

- ජාතික මට්ටමේ දී එක් එක් තරග අංශයන්ට අදාළව ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන ලබා ගත් ජයග්‍රාහකයන්ගේ තරග ප්‍රතිඵල ලේඛන සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබේ.

- ජාතික මට්ටමේ ජයග්‍රාහකයින් අගයනුවස් සහතිකපත්‍ර සහ මූල්‍ය ත්‍යාග පිරිනැමීම සඳහා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් තීරණය කරනු ලබන ස්ථානයකදී සහ දිනයකදී **ජාතික සාහිත්‍ය උත්සවය පවත්වනු ලැබේ.**

තරග විස්තර

| අනු අංකය | වයස් කාණ්ඩය | ශ්‍රේණිය |
|---|---|---|
| 01 | ප්‍රාථමික අංශය | 1 හා 2 ශ්‍රේණි |
| 02 | පශ්චාත් ප්‍රාථමික අංශය | 3,4 හා 5 ශ්‍රේණි |
| 03 | කනිෂ්ඨ අංශය | 6,7 ,8 හා 9 ශ්‍රේණි |
| 04 | ජ්‍යෙෂ්ඨ අංශය | 10 හා11 ශ්‍රේණි |
| 05 | ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශය | 12 හා 13 ශ්‍රේණි |
| 06 | විවෘත අංශය | වයස අවු: 19ට වැඩි |

## 1. ප්‍රාථමික අංශය (1හා 2 ශ්‍රේණි)

### 1.1 කතන්දරයක් ඉදිරිපත් කිරීමේ තරගය

තමන් අසා ඇති කතන්දරයක් විනාඩි 2-3 අතර කාලයක් තුළ දී නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ. සිසුන්ගේ පාසල් ගමනේ ආරම්භක කාල සීමාව වන බැවින්, පෙර පාසලින් ලත් අත්දැකීම් පෙරදැරිව වඩාත් නිර්මාණශීලීව මෙම තරගය පැවැත්වීම අපේක්ෂා කෙරේ. තෝරාගනු ලබන කතන්දර නිර්මාණයට සුදුසු ඇඳුමකින් සැරසී ඉදිරිපත් කිරීම සිදු කළ හැකිය.

ලකුණු ලබාදීමේ දී හඬ පාලනය හා නිවැරදි භාෂා භාවිතය, කතන්දරය නිර්මාණශීලිව ගොඩනැංවීම හා ඉදිරිපත් කිරීම මෙන්ම එයින් සමාජයට ලබාදෙන පණිවිඩය කෙරහි අවධානය යොමුකරනු ඇත.

## 2. පශ්චාත් ප්‍රාථමික අංශය (3,4 හා 5 ශ්‍රේණි)

### 2.1 ළමා කතන්දර නිර්මාණ තරගය

**දරුවන්ගේ නිර්මාණශීලී චින්තනය වර්ධනය කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ. ඔවුන්ගේ අභිමතය පරිදි, චිත්‍ර සටහන් ද සහිතව, A 4 ප්‍රමාණයේ පිටු 02කට වැඩි (තනි පැත්ත පමණක් භාවිතා කළ යුතුය), ලිඛිත නව ළමා කතන්දර නිර්මාණයක් විය යුතුය.**

**ළමා කතන්දරය විරාම ලක්ෂණ, පැහැදිලි අත් අකුරින් කියවීමට හැකිවන ආකාරයෙන් සමන්විත විය යුතුය. සමස්ත කතාවේ නිර්මාණශීලීත්වය සහ සමාජයට ලබාදෙන පණිවිඩය තරග නිර්ණායක වශයෙන් සලකනු ලබයි.**

### 2.2 ජන ගායනා

**තමන් කැමති ජන කවියක් සහ 'සිරිත් මල්දම',' ලෝවැඩ සඟරාව',' සුභාෂිතය' යන කාව්‍ය සංග්‍රහ අතුරින් තම අභිමත පරිදි තෝරා ගන්නා ලද කවියක් ඉදිරිපත් කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ.**
**(සංගීත භාණ්ඩ භාවිතයෙන් වැළකිය යුතුය.)**

3. <u>කනිෂ්ඨ අංශය (6,7, 8 හා 9 ශ්‍රේණි)</u>

### 3.1 ජනකතා ප්‍රතිනිර්මාණය කිරීමේ තරගය

අතීත ජනයා අතර නිර්මාණය වී මුඛ පරම්පරාගත ව පැවත ආ ජනකතා බොහෝමයක් අප සමාජයේ පවතී. මෙම වයස් කාණ්ඩවල සිසුන් ජනශ්‍රැති පරිශීලනයට උනන්දුව වර්ධනය කිරීම අරමුණු කර ගෙන පවත්වනු ලබන මෙම තරගය මගින් **ළමා පරපුරට වැදගත් වන උපදේශයක් හෝ වැදගත් සමාජ පණිවිඩයක් සහිත ජනකතාවක්** අසා රසවිඳ එහි සාහිත්‍යමය ගුණය ඉස්මතු වන පරිදි නිර්මාණශීලිව ඉදිරිපත් කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ.

තම අභිමතය පරිදි සුදුසු ජනශ්‍රැතියක් තෝරා ගත හැකි අතර, නැවත ප්‍රතිනිර්මාණය කිරීමේ දී වචන 750-1000 අතර ප්‍රමාණයකට සීමා විය යුතුය. ලකුණු ලබාදීමේ දී පැහැදිලි අත් අකුරු, භාෂා හැකියාව, අක්ෂර වින්‍යාසය මෙන්ම සාහිත්‍යමය රසය ඉස්මතු වන පරිදි නිර්මාණශීලි ව ඉදිරිපත් කිරීම හා සමාජයට ලබාදෙනු ලබන පණිවුඩය කෙරෙහි අවධානය යොමු කර ලකුණු ලබා දෙනු ලැබේ.

### 3.2 පද්‍ය රචනා - සඳැස් / නිසඳැස් තරගය

අභිමත මාතෘකාවක් යටතේ ලියවෙන සඳැස් හෝ නිසඳැස් නිර්මාණයක් මෙහිදී අපේක්ෂා කෙරේ.

කාව්‍යෝක්ති භාවිතය, භාෂා භාවිතය, අන්තර්ගතය සහ අත්දැකීමේ නව්‍යතාවය යන කරුණු පිළිබඳව අවධානය යොමු කළ යුතුය. ලකුණු ලබා දීමේ දී මෙම උපදෙස්වලට අනුව නිර්මාණය සිදු කර තිබේ දැයි සලකා බලනු ලැබේ.

### 3.3. පද්‍ය ගායනා තරගය

**මෙහිදී ප්‍රාදේශීය තරග සඳහා, ආසාතාත්මක හෝ අනාසාතාත්මක ජන ගායනයක්, 'ලෝවැඩ සඟරාව', 'සිරිත් මල්දම', 'සුභාෂිතය' ආශ්‍රයෙන් තෝරාගත් පද්‍ය ගායනයක්, නූර්ති, නාඩගම් හෝ නාට්‍ය ගීත ඇසුරින් තෝරාගත් ගීතයක් වශයෙන් ගායනා 03ක් ඉදිරිපත් කිරීම සිදු කළ යුතුය.**

**දිස්ත්‍රික් තරග සඳහා, ආසාතාත්මක ජන ගායනයක් සහ අනාසාතාත්මක ජන ගායනයක් සමග 'ලෝවැඩ සඟරාව', 'සිරිත් මල්දම', 'සුභාෂිතය' ආශ්‍රයෙන් තෝරාගත් පද්‍ය ගායනයක්, නූර්ති, නාඩගම් හෝ නාට්‍ය ගීත ඇසුරින් තෝරාගත් ගීතයක් වශයෙන් ගායනා 04 ක් ඉදිරිපත් කිරීම සිදු කළ යුතුය.**

**මෙම ඉදිරිපත් කිරීම්වල දී ගායනයට උචිත ශ්‍රැතියක් තෝරාගැනීමට මෙන්ම අංග චලනය, භාව ප්‍රකාශනය කෙරෙහි ද අවධානය යොමු කළ යුතුය. ගායනය ප්‍රධාන ලෙස අගයන අතර, ලකුණු ලබා දිමේ දී පැහැදිලි හා නිරවුල් උච්චාරණය, හඬ පාලනය යනාදි කරුණු කෙරෙහි අවධානය යොමු කරනු ඇත.**

**(සංගීත භාණ්ඩ භාවිතයෙන් වැළකිය යුතුය.)**

## **4.ජ්‍යෙෂ්ඨ අංශය (10 හා11 ශ්‍රේණි)**

### **4.1 සාහිත්‍ය විචාර තරගය**

**පහත සඳහන් කෘති අතරින් තම අභිමතය පරිදි තෝරා ගත් කෘතියක් පිළිබඳව වචන 750 – 1000ත් අතර සාහිත්‍යමය විචාරයක් මෙහි දී අපේක්ෂා කෙරේ.**

**i. මාර්ටින් වික්‍රමසිංහ සූරීන් විසින් රචිත ‘මඩොල් දූව’ නවකතාව**
**ii. මහගමසේකරයන් විසින් රචිත ‘තුංමංහන්දිය’ නවකතාව**
**iii. ආචාර්ය දොන් පීටර් පියතුමන් විසින් රචිත”වනගත ළමෝ’යොවුන් නවකතාව**
**iv.කේ.පී. ගුණරත්න මහතා විසින් පරිවර්තිත ‘බැද්දේගම’ නවකතව**

### **4.2 පද්‍ය රචනා - සඳැස් / නිසඳැස් තරගය**

අභිමත මාතෘකාවක් යටතේ ලියවෙන සඳැස් හෝ නිසඳැස් නිර්මාණයක් මෙහිදී අපේක්ෂා කෙරේ.

කාව්‍යෝක්ති භාවිතය, භාෂා භාවිතය, අන්තර්ගතය සහ අත්දැකීමේ නව්‍යතාවය යන කරුණු පිළිබඳව අවධානය යොමු කළ යුතුය. ලකුණු ලබා දීමේ දී මෙම උපදෙස්වලට අනුව නිර්මාණය සිදු කර තිබේ දැයි සලකා බලනු ලැබේ.

### **4.3. පද්‍ය ගායනා තරගය**

**මෙහිදී ප්‍රාදේශීය තරග සඳහා ආසාතාත්මක හෝ අනාසාතාත්මක ජන ගායනයක්, ‘සැළලිහිණි සංදේශය හෝ ‘ගුත්තිල කාව්‍යය’ යන කාව්‍ය සංග්‍රහ ආශ්‍රයෙන් තෝරාගත් පද්‍ය ගායනයක්, නූර්ති, නාඩගම් හෝ නාට්‍ය ගීත ඇසුරින් තෝරාගත් ගීතයක් වශයෙන් ගායනා 03ක් ඉදිරිපත් කළ යුතුය.**

**දිස්ත්‍රික් තරග සඳහා, ආසාතාත්මක ජන ගායනයක් සහ අනාසාතාත්මක ජන ගායනයක් සමග , ‘සැළලිහිණි සංදේශය’හෝ ‘ගුත්තිල කාව්‍යය’ යන කාව්‍ය සංග්‍රහ ආශ්‍රයෙන් තෝරාගත් පද්‍ය ගායනයක්, නූර්ති, නාඩගම් හෝ නාට්‍ය ගීත ඇසුරින් තෝරාගත් ගීතයක් වශයෙන් ගායනා 04 ක් ඉදිරිපත් කිරීම සිදු කළ යුතුය.**

**මෙම ඉදිරිපත් කිරීම්වල දී ගායනයට උචිත ශ්‍රැතියක් තෝරාගැනීමට මෙන්ම අංග චලනය, භාව ප්‍රකාශනය කෙරෙහි ද අවධානය යොමු කළ යුතුය. ගායනය ප්‍රධාන ලෙස අගයන අතර, ලකුණු ලබා දිමේ දී පැහැදිලි හා නිරවුල් උච්චාරණය, හඬ පාලනය යනාදි කරුණු කෙරෙහි අවධානය යොමු කරනු ඇත.**

**(සංගීත භාණ්ඩ භාවිතයෙන් වැළකිය යුතුය.)**

## 5. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශය (12 හා 13 ශ්‍රේණි)

### 5.1 සාහිත්‍ය විචාර තරගය

**පහත සඳහන් කෘතින් අතරින් තම අභිමතය පරිදි තෝරා ගත් කෘතියක් පිළිබඳව වචන 1000 - 1500ත් අතර සාහිත්‍යමය විචාරයක් මෙහිදී අපේක්ෂා කෙරේ.**

i. චන්ද්‍රරත්න බණ්ඩාර සූරින් විසින් රචිත 'ප්‍රේමානිශංස' නවකතාව
ii. කරුණාසේන ජයලත් සූරින් විසින් රචිත 'ගොළු හදවත ' නවකතාව
iii. විරාජිනී තෙන්නකෝන් මහත්මිය විසින් රචිත 'කැමීලියා' නවකතාව

### 5.2 පද්‍ය රචනා - සඳැස් / නිසඳැස් තරගය

අභිමත මාතෘකාවක් යටතේ ලියවෙන සඳැස් හෝ නිසඳැස් නිර්මාණයක් මෙහිදී අපේක්ෂා කෙරේ.

කාව්‍යෝක්ති භාවිතය, භාෂා භාවිතය, අන්තර්ගතය සහ අත්දැකීමේ නව්‍යතාවය යන කරුණු පිළිබඳව අවධානය යොමු කළ යුතුය. ලකුණු ලබා දීමේ දී මෙම උපදෙස්වලට අනුව නිර්මාණය සිදු කර තිබේ දැයි සලකා බලනු ලැබේ.

### 5.3 ගීත රසවින්දන තරගය

**පහත සඳහන් ගීත අතුරින් තමන් කැමති ගීතයක් පිළිබඳව වචන 750 – 1500ත් අතර රසවින්දනයක් අපේක්ෂා කෙරේ.**

i. විශාරද මාලනී බුලත්සිංහලයන් විසින් ගායනා කරනු ලබන 'රජමැදුරක ඉපදී සිටියා නම්' ගීතය
ii. තරිඳු දම්සර මහතා විසින් ගායනා කරනු ලබන 'හීන පොදි' ගීතය
iii. විශාරද එඩ්වඩ් ජයකොඩි මහතා විසින් ගායනා කරනු ලබන 'ඉස්සර විදිහට දුව පැන යනඑක' ගීතය

### 5.4. කෙටිකතා නිර්මාණ තරගය

**අදාළ වයස් කාණ්ඩයේ දරුවන්ගේ නිර්මාණශීලී චින්තනය ප්‍රකට කෙරෙන කෙටිකතාවක් අපේක්ෂා කෙරෙන අතර, එම නිර්මාණය කෙටි කතා රීතීන්ට අනුකූල විය යුතුය.**

### 5.5 පද්‍ය ගායනා තරගය

**මෙහිදි ප්‍රාදේශීය තරග සඳහා ආසාතාත්මක හෝ අනාසාතාත්මක ජන ගායනයක්, 'යසෝදරාවත', 'ගුත්තිල කාව්‍යය', 'හංස සංදේශය' ආශ්‍රයෙන් තෝරාගත් පද්‍ය ගායනයක්, නූර්ති, නාඩගම් හෝ නාට්‍ය ගීත ඇසුරින් තෝරාගත් ගීතයක් වශයෙන් ගායනා 03ක් ඉදිරිපත් කිරීම සිදු කළ යුතුය.**

**දිස්ත්‍රික් තරග සඳහා, ආසාතාත්මක ජන ගායනයක් සහ අනාසාතාත්මක ජන ගායනයක් සමග, 'යසෝදරාවත', 'ගුත්තිල කාව්‍යය', 'හංස සංදේශය' ආශ්‍රයෙන් තෝරාගත් පද්‍ය ගායනයක්, නූර්ති, නාඩගම් හෝ නාට්‍ය ගීත ඇසුරින් තෝරාගත් ගීතයක් වශයෙන් ගායනා 04 ක් ඉදිරිපත් කිරීම සිදු කළ යුතුය.**

**මෙම ඉදිරිපත් කිරීම්වල දී ගායනයට උචිත ශ්‍රැතියක් තෝරාගැනීමට මෙන්ම අංග චලනය, භාව ප්‍රකාශනය කෙරෙහි ද අවධානය යොමු කළ යුතුය. ගායනය ප්‍රධාන ලෙස අගයන අතර, ලකුණු ලබා දිමේ දී පැහැදිලි හා නිරවුල් උච්චාරණය, හඬ පාලනය යනාදි කරුණු කෙරෙහි අවධානය යොමු කරනු ඇත.**

**(සංගීත භාණ්ඩ භාවිතයෙන් වැළකිය යුතුය.)**

## 6. විවෘත අංශය- 2025.01.31 දිනට වයස අවු: 19 ට වැඩි අයදුම්කරුවන්

### 6.1 සිනමා විචාරය

පහත සඳහන් සිනමා කෘති අතරින් තම අභිමතය පරිදි තෝරා ගත් සිනමා නිර්මාණයක් පිළිබඳව වචන 2500-3000ත් අතර විචාරයක් මෙහිදි අපේක්ෂා කෙරේ.

i. ජයන්ත චන්ද්‍රසිරි මහතා විසින් අධ්‍යක්ෂණය කළ "අග්නි දාහය" සිනමා කෘතිය
ii. ප්‍රසන්න විතානගේ මහතා විසින් අධ්‍යක්ෂණය කළ "පුරහඳ කළුවර" සිනමා කෘතිය
iii. බුද්ධි කීර්තිසේන මහතා විසින් අධ්‍යක්ෂණය කළ "මිල්ලෙ සොයා" සිනමා කෘතිය

### 6.2 කෙටිකතා තරගය

කෙටිකතා නිර්මාණයේ දී භාවිත කරනු ලබන රීතිවලට අනුකූලව තමා කැමති ඕනෑම තේමාවක් යටතේ කෙටිකතා නිර්මාණයක් ඉදිරිපත් කළ හැකිය.

### 6.3 පද්‍ය රචනා - සඳැස් තරගය

අභිමත මාතෘකාවක් යටතේ පැදි 07-10 අතර නිර්මාණයක් ඉදිරිපත් කළ හැකිය.

එළිවැට සහ කාව්‍යෝක්ති භාවිතය, භාෂා භාවිතය, අන්තර්ගතය සහ අත්දැකීමේ නව්‍යතාවය යන කරුණු පිළිබඳ අවධානය යොමු කළ යුතුය. ලකුණු ලබා දීමේ දී මෙම උපදෙස්වලට අනුව නිර්මාණය සිදු කර තිබේ දැයි සලකා බලනු ලැබේ.

### 6.4.පද්‍ය රචනා - නිසඳැස් තරගය

අභිමත මාතෘකාවක් යටතේ පද පේළි 05-30 අතර නිසඳැස් නිර්මාණයක් ඉදිරිපත් කළ හැකිය.

මෙම නිසඳැස් නිර්මාණ සඳහා සරල හෝ විශේෂ භාෂාමය ගුණාංග භාවිත කළ හැකිය. එමෙන්ම නිසඳැස් පද්‍ය සඳහා ඕනෑම භාෂා අලංකාරයක් යොදා ගත හැකිය. ලකුණු ලබා දීමේ දී ඉහත උපදෙස්වලට අනුව නිර්මාණය සිදු කර තිබේදැයි සලකා බලනු ඇත.

### 6.5. ළමා කතන්දර නිර්මාණ තරගය

වයස අවුරුදු 05 සිට 10 දක්වා ළමයින්ට සුදුසු වන තේමාවක් යටතේ ළමා කතන්දරයක් නිර්මාණය කළ යුතුය. අකුරු ප්‍රමාණය 20 වන පරිගණක අක්ෂර සංයෝජනය කරන ලද A4 ප්‍රමාණයේ පිටු 16 කට නොවැඩි (තනි පැත්ත පමණක්) විචිත්‍රවත් නිර්මාණාත්මක ළමා කතන්දර පොතක් මෙහිදී අපේක්ෂා කෙරේ.

<u>දිස්ත්‍රික් /ප්‍රාදේශීය සංස්කෘතික නිලධාරීන් විසින් අවධානය යොමු කළ යුතු විශේෂ කරුණු</u>

- ❖ සියලු තරග අංශ මෙම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව පැවැත්විය යුතුය.

- ❖ නියමිත කාල සීමාව ඇතුලත තරග පවත්වා, චක්‍රලේඛයේ අමුණා ඇති ආදර්ශ ප්‍රතිඵල ලේඛනයට අනුව පමණක්, අදාළ වන පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හෝ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිඵල ලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

- ❖ ප්‍රාදේශීය මට්ටමේ තරග අංශයන්හි ජයග්‍රහණය කරන ලද ජයග්‍රාහකයින්ගේ ප්‍රතිඵල ලේඛනය සහ ප්‍රථම ස්ථාන ලබාගත් නිර්මාණ පමණක් අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු අතර, දිස්ත්‍රික් මට්ටමේ තරග අංශයන්හි ජයග්‍රහණය කරන ලද ජයග්‍රාහකයින්ගේ ප්‍රතිඵල ලේඛනය සහ ප්‍රථම ස්ථාන ලබාගත් නිර්මාණ පමණක් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත යොමු කළයුතු වේ.

- ❖ **දිස්ත්‍රික් මට්ටමේ ප්‍රතිඵල සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමේ දී අදාළ අයදුම්පත සමග ජයග්‍රාහකයින්ගේ පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක් ද ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.**

- ❖ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබන නිර්මාණ නැවත අදාළ තරගකරු වෙත ලබාදීමට කටයුතු නොකරන බවත්, එම නිර්මාණයන්හි පිටපතක් තමන් සතුව තබා ගැනීමට කටයුතු කරන ලෙසත් තරගකරුවන් වෙත අවධාරණයෙන් යුතුව දැන්විය යුතුය.

- ❖ එක් එක් තරග අංශයට අදාළව ප්‍රාදේශීය / දිස්ත්‍රික් මට්ටමින් ජයග්‍රහණය කරනු ලබන තරගකරුවන් සඳහා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන සහතිකපත් අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත භාර දෙනු ලැබේ. එම සහතිකපත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නොපමාව භාර දී භාර ගත් බවට වන අත්සන් ලේඛනයේ පිටපතක් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

- ❖ චක්‍රලේඛය මගින් ඉදිරිපත් කර ඇති තරග අංශවලට පරිබාහිරව පවත්වනු ලබන කිසිදු තරග අංශයක් සඳහා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් සහතිකපත් නිකුත් කරනු නොලැබේ. ප්‍රාදේශිය/ දිස්ත්‍රික් මට්ටමේ තරග සඳහා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන සහතිකපත් අදාළ තරග අංශයන්හි ජයග්‍රාහකයින් වෙත පමණක්ම ලබා දිය යුතු වේ. කිසිදු තරග අංශයක් සඳහා කුසලතා සහතිකපත් නිකුත් කරනු නොලැබේ.

- ❖ **එක් වරක් සහතිකපත් නිකුත් කළ පසු කුමන හේතුවක් මත හෝ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් නැවත සහතිකපත් නිකුත් කරනු නොලැබේ.**

- ❖ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සේවය කරන කිසිදු නිලධාරියෙකුට හෝ එවැනි නිලධාරියෙකුගේ පවුලේ සාමාජිකයින්ට හා දිස්ත්‍රික් /ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සංස්කෘතික විෂය භාර නිලධාරියෙකුට හෝ එවැනි නිලධාරියෙකුගේ පවුලේ සාමාජිකයින්ට මෙම තරගය සඳහා අයදුම් කළ නොහැකි බව විශේෂයෙන් අවධාරණය කරනු ලැබේ.

# <u>ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික සාහිත්‍ය උත්සව සඳහා වන පොදු කොන්දේසි මාලාව</u>

- මෙම තරග සඳහා ඉදිරිපත් කරනු ලබන සියලු නිර්මාණ ස්වනිර්මාණ විය යුතු අතර, එම නිර්මාණ මීට පෙර කිසිදු තරගයකට ඉදිරිපත් නොවූ නිර්මාණයක් විය යුතුය. අයදුම්කරුගේ අභිමතය පරිදි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් නිර්මාණ ඉදිරිපත් කළ හැකිය.

- කිසිදු නිර්මාණයක් සඳහා කෘත්‍රිම බුද්ධි (AI) තාක්ෂණය භාවිත නොකළ යුතු අතර, සමාජ මාධ්‍ය හෝ වෙනත් මාධ්‍යයක් තුළ පළ වූ වෙනත් නිර්මාණකරුවකුගේ නිර්මාණ පිටපත් කිරීමෙන් වැළකී තම නිර්මාණ ඉදිරිපත් කළ යුතුය. එබඳු නිර්මාණ පිළිබඳ අදාළ නිර්මාණයේ අයිතිකරු විසින් ගනු ලබන නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් වගකීම් දරනු නොලැබේ.

- එක් තරගකරුවෙකුට තරග කොන්දේසිවලට යටත්ව තරග අංශ කිහිපයකට වුවද ඉදිරිපත් විය හැකි නමුත්, එක් තරග අංශයක් සඳහා ඉදිරිපත් කල හැක්කේ එක් නිර්මාණයක් පමණක් වේ.

- ලිඛිත නිර්මාණ තමන්ට අභිමත පරිදි අත් අකුරෙන් හෝ යතුරු ලියනය කර හෝ ඉදිරිපත් කළ හැකි අතර, ඒ සඳහා ෆුල්ස්කැප් හෝ A4 කඩදාසියේ තනි පැත්ත භාවිත කළ යුතුය. නිර්මාණ සිදු කරන කඩදාසියේ කිසිදු ලකුණක්, විශේෂ සටහනක්, තමාගේ නම හෝ වෙනත් තොරතුරු ඇතුළත් කිරීමෙන් තරගකරුවන් වැළකිය යුතුවේ.

- තරග සඳහා සහභාගි වන තරගකරුවන් තම නිර්මාණය ස්වනිර්මාණයක් බවට සහතික කරවා ගත යුතුය. ඒ සඳහා තම පන්සලේ නායක ස්වාමීන්වහන්සේගේ, පූජකතුමන්ගේ, ප්‍රාදේශීය ලේකම්ගේ, විදුහල්පතිගේ, කලායතනාධිපතිගේ අත්සනින් සහ නිල මුද්‍රාවෙන් සනාථ කළ යුතුය. විවෘත අංශය යටතේ ඉදිරිපත් වන තරගකරුවන් තම පදිංචිය පිළිබඳව තමා අයත් ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී මගින් සනාථ කර ගත යුතුය.

- මෙම උපදෙස් මාලාවට පටහැනිව ඉදිරිපත් කරන නිර්මාණ ප්‍රාදේශීය මට්ටමේ දී ප්‍රාදේශීය ලේකම් විසින් ද, දිස්ත්‍රික් මට්ටමේ දී දිස්ත්‍රික් ලේකම් විසින් ද, ජාතික මට්ටමේ දී සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ විසින් ද තරගයෙන් ඉවත් කරනු ලැබිය හැක.

- ජයග්‍රාහී නිර්මාණ පිළිබඳව ඉදිරිපත් කරන පැමිණිලි පරීක්ෂා කිරීමෙන් පසු ඒවා සනාථ වුවහොත් සහතික හා ත්‍යාග ප්‍රදානය නොකරන අතර, සහතිකපත්‍ර හා ත්‍යාග ප්‍රදානයෙන් පසුව කෙරෙන පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේ දී එම කරුණු සනාථ වුවහොත්, තරග අංශයට අදාළ සියලුම හිමිකම් අහිමි වනු ඇත.

- සෑම තරගකරුවෙක්ම තම නිර්මාණය සමග සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් සකස් කර ඇති ආදර්ශ අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු වේ.

- මෙම තරගාවලියේ සියලු අදියරවලදී අදාළ සමීක්ෂණ මණ්ඩල විසින් ගනු ලබන තීරණවලට අයදුම්කරුවන් යටත්විය යුතු අතර, සමීක්ෂණ මණ්ඩලයන්හි නිර්දේශ මත පදනම්ව සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ විසින් ගනු ලබන තීරණ අවසන් තීරණ වේ.

.......................................

කේ.එස්. දිල්හානි
සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ

කේ.එස්. දිල්හානි
අධ්‍යක්ෂ
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
සෙත්සිරිපාය, බත්තරමුල්ල.

ඇමුණුම. 01

## ප්‍රාදේශීය දිස්ත්‍රික් හා ජාතික සාහිත්‍ය උත්සවය - 2025

### ආදර්ශ අයදුම් පත්‍රය

1. සම්පූර්ණ නම : ..........................................................................................
..........................................................................................
2. මුල’කුරු සමඟ නම : ..........................................................................................
3. මුල’කුරු සමග නම (ඉංග්‍රීසියෙන්) : ..........................................................................................
..........................................................................................
4. පෞද්ගලික ලිපිනය : ..........................................................................................
5. උපන් දිනය : ..........................................................................................
6. පෞද්ගලික දුරකථන අංකය :..........................................................................................
7. WhatsApp පහසුකම සහිත දුරකතන අංකය: ..........................................................................
8. 2025.01.31 දිනට වයස : අවු ........ මාස ......... දින........
9. තරග අංශය : ප්‍රාථමික ☐ පශ්. ප්‍රාථමික ☐ කනිෂ්ඨ ☐ ජ්‍යෙෂ්ඨ ☐
ජ්‍යෙෂ්ඨ ද්විතීයික ☐
10. ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................
11. පිරිවෙණ / පාසල / දහම් පාසල / කලායතනයෙහි තොරතුරු

ආයතනයේ නම : ..........................................................................................

ලිපිනය :..........................................................................................

දුරකතන අංකය : ..........................................................................................

12. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..........................................................................................
13. දිස්ත්‍රික්කය : ..........................................................................................
14. ඉදිරිපත්වන තරග අංශය : ..........................................................................................
15. භාෂා මාධ්‍ය : ..........................................................................................
16. නිර්මාණයේ නම : ..........................................................................................

අයදුම්කරුගේ ප්‍රකාශය

ඉහත සඳහන් තොරතුරු මාගේ දැනුම ප්‍රකාරව සත්‍ය හා නිවැරදි බවද , මෙම අයදුම්පතේ අනු අංක 16 යටතේ සඳහන් නිර්මාණය මාගේ ස්වනිර්මාණයක් බව ද, එම නිර්මාණය වෙනත් තරගයක් සඳහා ඉදිරිපත් කර නොමැති බව ද, වෙනත් කිසිදු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් මෙම තරගය සඳහා ඉදිරිපත් වී නොමැති බවද, සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ විසින් මෙම තරගයට අදාළව පනවා ඇති තරග කොන්දේසි හා උපදෙස් පිළිගැනීමට එකඟවන බවද, මෙයින් ප්‍රකාශකර සිටිමි.

දිනය ....................................                                        ..........................................
අයදුම්කරුගේ අත්සන

<u>අයදුම්කරුගේ නිර්මාණයක් බවට සහතික කිරීම</u>

**.......................................................................................................................................යන ලිපිනයේ පදිංචි.......................................................................................................................**

**ස්වාමින්වහන්සේ / සිසුවා / සිසුවිය .................................... දින මා ඉදිරිපිට දී අත්සන් තැබූ බව ද ඉහත අංක 08 හි සඳහන් වන වයස නිවැරදි බවද අංක 16 හි සඳහන් නිර්මාණය අයදුම්කරුගේ ස්වනිර්මාණයක් බවද මෙයින් සහතික කරමි.**

**දිනය ....................................** **...........................................**

**සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව**

**ඉහත සඳහන් සියලු තොරතුරු පරීක්ෂා කළ බවත් නිවැරදි බවත් නිර්දේශ කරමි.**

**දිනය ....................................** **..................................................**

**සංස්කෘතික නිලධාරි/ සංස්කෘතික සං.සහකාර / සං.නිලධාරි**

**ඉහත සඳහන් නිර්මාණය තරගාවලිය සඳහා සුදුසු බවට අනුමත කරමි.**

**දිනය ....................................** **..................................................**

**ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන සහ නිල මුද්‍රාව**

ඇමුණුම. 02

**ප්‍රාදේශීය දිස්ත්‍රික් හා ජාතික සාහිත්‍ය උත්සවය - 2025**

**<u>ආදර්ශ අයදුම් පත්‍රය</u>**

**<u>විවෘත අංශය</u>**

**1.** සම්පූර්ණ නම : ..........................................................................................

..........................................................................................

**2.** මුල්'කුරු සමග නම : ..........................................................................................

**3.** මුල්'කුරු සමග නම (ඉංග්‍රීසියෙන්) : ..........................................................................................

..........................................................................................

**4.** ලිපිනය : ..........................................................................................

**5.** උපන් දිනය : ..........................................................................................

**6.** පෞද්ගලික දුරකථන අංකය : ..........................................................................................

**7.** **WhatsApp** පහසුකම සහිත දුරකතන අංකය : ..........................................................................

**8.** **2025.01.01** දිනට වයස : අවු ........ මාස ......... දින........

**9.** ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................

**10.** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..........................................................................................

**11.** දිස්ත්‍රික්කය : ..........................................................................................

**12.** ඉදිරිපත්වන තරග ඉසව්ව : ..........................................................................................

**13.** භාෂා මාධ්‍ය : ..........................................................................................

**14.** නිර්මාණයේ නම : ..........................................................................................

<u>අයදුම්කරුගේ ප්‍රකාශය</u>

ඉහත සඳහන් තොරතුරු මාගේ දැනුම ප්‍රකාරව සත්‍ය හා නිවැරැදි බවද , මෙම අයදුම්පතේ අනු අංක 14 යටතේ සඳහන් නිර්මාණය මාගේ ස්වනිර්මාණයක් බව ද, එම නිර්මාණය වෙනත් තරගයක් සඳහා ඉදිරිපත් කර නොමැති බව ද, වෙනත් කිසිදු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් මෙම තරගය සඳහා ඉදිරිපත් වී නොමැති බවද, සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ විසින් මෙම තරගයට අදාළව පනවා ඇති තරග කොන්දේසි හා උපදෙස් පිළිගැනීමට එකඟවන බවද, මෙයින් ප්‍රකාශකර සිටිමි.

දිනය ..................................... ..............................................

අයදුම්කරුගේ අත්සන

<u>අයදුම්කරුගේ පදිංචිය සහතික කිරීම</u>

**..........................................................................................................................ලිපිනයේ**

**පදිංචි...............................................................................................ස්වාමින්වහන්සේ /මහතා / මහත්මිය / මෙනෙවිය/..................................දින මා ඉදිරිපිට දී අත්සන් තැබූ බවත්, අයදුම්කරු මෙම ග්‍රාම නිලධාරී වසමේ පදිංචි බවත් මෙයින් සහතික කරමි.**

දිනය .................................... ........................................................

ග්‍රාම නිලධාරි අත්සන සහ නිල මුද්‍රාව

**ඉහත සඳහන් සියලු තොරතුරු පරීක්ෂා කළ බවත් නිවැරදි බවත් නිර්දේශ කරමි.**

දිනය .................................... ..................................................

**සංස්කෘතික නිලධාරි/සංස්කෘතික සං.සහකාර/ සං.නිලධාරි**

**ඉහත සඳහන් නිර්මාණය තරගාවලිය සඳහා සුදුසු බවට අනුමත කරමි.**

දිනය .................................... ..................................................

ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන සහ නිල මුද්‍රාව

## ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික සාහිත්‍ය තරග ප්‍රතිඵල-2025
## සහතිකපත් ලබා දීමේ ආකෘති පත්‍රය

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය: - ……………………………………………**

**මාධ්‍යය:- සිංහල**

| | **ප්‍රා.ලේ.කාර්යාලයේ නම** | **අවශ්‍ය සහතික පත් ප්‍රමාණය** | | |
|---|---|---|---|---|
| | | **සිංහල** | **දෙමල** | **ඉංග්‍රීසි** |
| **1** | | | | |
| **2** | | | | |
| **3** | | | | |
| **4** | | | | |
| **5** | | | | |
| **6** | | | | |
| **7** | | | | |
| **8** | | | | |
| **9** | | | | |
| **10** | | | | |
| **11** | | | | |
| **12** | | | | |
| **13** | | | | |
| **14** | | | | |
| **15** | | | | |
| 16 | | | | |
| **17** | | | | |
| **19** | | | | |
| **20** | | | | |
| **21** | | | | |
| **22** | | | | |
| **23** | | | | |
| **24** | | | | |
| **25** | | | | |
| | එකතුව | | | |

**ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව සහතික කරමි.**

**සකස් කළේ :- …………………………………………**

……………………………………………

දිස්ත්‍රික් ලේකම්ගේ අත්සන සහ නිල මුද්‍රාව

අත්සන :- …………………………………………

දිනය :- …………………………………